## වාරි පෝෂිත

**වයස මාස 3** — **අක්කර 1ක් සඳහා කි.ග්‍රෑ.**

| යෙදිය යුතු කාලය | යූරියා | ටී.එස්.පී | එම්.ඕ.පී |
|---|---|---|---|
| මූලික පොහොර | | 22 | |
| වපුරා සති 2න්/ සිටුවා සති 2න් | 20 | | |
| වපුරා සති 4න්/ සිටුවා සති 3න් | 30 | | 10 |
| වපුරා සති 6න්/ සිටුවා සති 5න් | 26 | | 14 |
| වපුරා සති 7න්/ සිටුවා සති 6න් | 14 | | |
| එකතුව | 90 | 22 | 24 |

*මහ කන්නයට සින්ක් සල්ෆේට් අක්.ට කි.ග්‍රෑ. 2 ක් මූලික පොහොරට යෙදිය යුතුය

**වයස මාස 3 1/2** — **අක්කර 1ක් සඳහා කි.ග්‍රෑ.**

| යෙදිය යුතු කාලය | යූරියා | ටී.එස්.පී | එම්.ඕ.පී |
|---|---|---|---|
| මූලික පොහොර | | 22 | |
| වපුරා සති 3න්/ සිටුවා සති 2න් | 20 | | |
| වපුරා සති 5න්/ සිටුවා සති 4න් | 30 | | 10 |
| වපුරා සති 7න්/ සිටුවා සති 6න් | 26 | | 14 |
| වපුරා සති 8න්/ සිටුවා සති 7න් | 14 | | |
| එකතුව | 90 | 22 | 24 |

*මහ කන්නයට සින්ක් සල්ෆේට් අක්.ට කි.ග්‍රෑ. 2 ක් මූලික පොහොරට යෙදිය යුතුය

**වයස මාස 4** — **අක්කර 1ක් සඳහා කි.ග්‍රෑ.**

| යෙදිය යුතු කාලය | යූරියා | ටී.එස්.ප | එම්.ඕ.ප. |
|---|---|---|---|
| මූලික පොහොර | | 22 | |
| වපුරා සති 3න්/ සිටුවා සති 2න් | 20 | | |
| වපුරා සති 6න්/ සිටුවා සති 5න් | 30 | | 10 |
| වපුරා සති 8න්/ සිටුවා සති 7න් | 26 | | 14 |
| වපුරා සති 9න්/ සිටුවා සති 8න් | 14 | | |
| එකතුව | 90 | 22 | 24 |

*මහ කන්නයට සින්ක් සල්ෆේට් අක්.ට කි.ග්‍රෑ. 2 ක් මූලික පොහොරට යෙදිය යුතුය

## වර්ෂා පෝෂිත

**වයස මාස 3** — **අක්කර 1ක් සඳහා කි.ග්‍රෑ.**

| යෙදියයුතු කාලය | යූරියා | ටී.එස්.ප. | එම්.ඕ.ප. |
|---|---|---|---|
| මූලික පොහොර | | 14 | |
| වපුරා සති 2න්/සිටුවා සති 2න් | 12 | | |
| වපුරා සති 4න්/සිටුවා සති 3න් | 26 | | 10 |
| වපුරා සති 6න්/සිටුවා සති 5න් | 20 | | 10 |
| වපුරා සති 7න්/සිටුවා සති 6න් | 12 | | |
| එකතුව | 70 | 14 | 20 |

*මහ කන්නයට සින්ක් සල්ෆේට් අක්.ට කි.ග්‍රෑ. 2 ක් මූලික පොහොරට යෙදිය යුතුය

**වයස මාස 3 1/2** — **අක්කර 1ක් සඳහා කි.ග්‍රෑ.**

| යෙදියයුතු කාලය | යූරියා | ටී.එස්.ප. | එම්.ඕ.ප. |
|---|---|---|---|
| මූලික පොහොර | | 14 | |
| වපුරා සති 3න්/සිටුවා සති 2න් | 12 | | |
| වපුරා සති 5න්/සිටුවා සති 4න් | 26 | | 10 |
| වපුරා සති 7න්/සිටුවා සති 6න් | 20 | | 10 |
| වපුරා සති 8න්/සිටුවා සති 7න් | 12 | | |
| එකතුව | 70 | 14 | 20 |

*මහ කන්නයට සින්ක් සල්ෆේට් අක්.ට කි.ග්‍රෑ. 2 ක් මූලික පොහොරට යෙදිය යුතුය

**පරිසරය ආරක්ෂා කරමින් වැඩි අස්වනු සඳහා පස් පරීක්ෂාකොට ඒ අනුව කුඹුරට ගැලපෙන පොහොර නිර්දේශය ලබාගන්න. වැඩි තොරතුරු සඳහා ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක හෝ 1920 අමතන්න**

# වී වගාව සඳහා පොහොර නිර්දේශය 2013

# වියළි සහ අතරමැදි කලාපය



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
2013

## 2013 නව පොහොර නිර්දේශයේ අරමුණු

- පොහොර භාවිතය කාර්යක්ෂම කිරීම මඟින් අපතේ යන පොහොර ප්‍රමාණය අවම කිරීම හා ස්වාභාවිකව ලැබෙන පෝෂක උපරිම අන්දමින් භාවිත කිරීම
- අනවශ්‍ය ලෙස පොහොර භාවිතය මඟින් සිදුවන පාරිසරික හා සෞඛ්‍ය හානි අවම කිරීම
- විවිධ පාරිසරික තත්ත්ව යටතේ ආර්ථිකමය ප්‍රශස්ථ අස්වැන්නක් දිගු කාලීනව තිරසාරව ලබා ගැනීම

## නව පොහොර නිර්දේශයේ විශේෂ ලක්ෂණ

- ස්වභාවිකව ලැබෙන නයිට්‍රජන් හා පොටෑසියම් උපරිම අයුරින් භාවිතයට ගැනීම සඳහා නයිට්‍රජන් හා පොටෑසියම් මූලික පොහොර ලෙස නොයෙදීම.
- කැටිති යූරියා වෙනුවට වැඩි කාර්යක්ෂමතාවයෙන් යුත් කණිකාමය යූරියා භාවිතා කිරීම
- ශාකයේ අවශ්‍යතාවය මත නයිට්‍රජන් පොහොර යෙදීම හා නයිට්‍රජන් අවශ්‍යතාවය තීරණය කිරීම සඳහා පත්‍ර වර්ණ දර්ශක භාවිතා කිරීම
- පාරිසරික හානිය අවම කිරීම සඳහා අවශ්‍ය පමණට පොස්පරස් උචිත අවස්ථාවේදී ලබාදීම.
- පුෂ්ප මූලාකෘති ඇති වීමේදී හා ධාන්‍ය පිරීමේදී එය හොඳින් සිදුවන ආකාරයට පොටෑසියම් පොහොර ලබාදීම
- රසායනික පොහොර වල කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා, කාබනික පෙහොර අනිවාර්යයෙන් යෙදීම

## නව පොහොර නිර්දේශය භාවිතයේදී සැළකියයුතු අනිවාර්යය කරුණු

**උපරිම ප්‍රතිඵල සඳහා අනිවාර්යයෙන්ම නිර්දේශිත කාබනික පොහොර ප්‍රමාණය භාවිතා කළයුතුය.**

- පෙර කන්නයේ ලද පිදුරු ප්‍රමාණය කුඹුරට නැවත යෙදීම.
- කුඹුරු අක්කරයකට ගොම කිලෝග්‍රෑම් 2000 ක් හෝ කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 2000 ක් හෝ දිරූ කුකුළු පොහොර කිලෝග්‍රෑම් 1000 ක් බිම් සැකසීමේදී පසට යෙදීම.
- කිලෝග්‍රෑම් 25 ක බර කොළ අතු මිටි 40 ක් යෙදීම.

**පොහොර නිර්දේශය මඟින් කරනු ලබන්නේ වැඩි අස්වැන්නක් සඳහා මඟ පෙන්වීමකි. රසායනික පොහොර පමණක් යෙදීමෙන් ඉහළ අස්වනු ලබාගැනීම අපහසුවේ**

**ඉහළ අස්වනු ලබා ගැනීම සඳහා,**

- කන්නයට වගා කිරීම.
- ප්‍රදේශයට, හා අදාළ කන්නයට ගැළපෙන වී ප්‍රභේදයක් තෝරා ගැනීම.
- ගුණාත්මයෙන් ඉහළ බීජ වී භාවිත කිරීම.
- ගැඹුරට පස පෙරලීම.
- මනා ජල පාලනය.
- නිසි පරිදි පලිබෝධ පාලනය.
- මනා වල් පාලනයක් කළ යුතුය.

## නිර්දේශිත ප්‍රදේශ

- අනුරාධපුර දිස්ත්‍රික්කය
- පොලොන්නරුව දිස්ත්‍රික්කය
- මුලතිව් දිස්ත්‍රික්කය
- හම්බන්තොට දිස්ත්‍රික්කය
- කුරුණෑගල දිස්ත්‍රික්කය
- යාපනය දිස්ත්‍රික්කය
- මොනරාගල දිස්ත්‍රික්කය
- වවුනියාව දිස්ත්‍රික්කය
- මඩකලපුව දිස්ත්‍රික්කය
- පුත්තලම දිස්ත්‍රික්කය
- මන්නාරම දිස්ත්‍රික්කය
- අම්පාර දිස්ත්‍රික්කය
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
- කිලිනොච්චි දිස්ත්‍රික්කය
- බදුල්ල දිස්ත්‍රික්කය
- මහනුවර දිස්ත්‍රික්කය - උඩුදුම්බර, පන්විල, මිනිපෙ මැදදුම්බර, කුණ්ඩසාලේ, පාතහේවාහැට, දෙල්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ
- නුවරඑළිය දිස්ත්‍රික්කය - හඟුරන්කෙත හා වලපනේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ
- රත්නපුර දිස්ත්‍රික්කය - ඇඹිලිපිටිය, කොලොන්න, බලංගොඩ, ඉඹුල්පේ, වැලිගෙපොල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ
- මාතර දිස්ත්‍රික්කය - හක්මන, කිරින්ද, දෙවිනුවර, දික්වැල්ල, තිහගොඩ හා කඹුරුපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ
- මාතලේ දිස්ත්‍රික්කය - මාතලේ, යටවත්ත හා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හැරුණු විට ඇති අනෙකුත් සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ